මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022 ජනවාරි මස 20 දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 01-2022 ජනවාරි

# සාර්ව ආර්ථික ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි

## තාවකාලික පසුබෑමකින් පසුව ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දත්ත අනුව, කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ලෙහි ව්‍යාප්තිය සහ එය පාලනය කිරීමට ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් බාධා වූ දේශීය ආර්ථික කටයුතු, 2021 වසරේ තුන්වන කාර්තුව තුළදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 1.5කින් සංකෝචනය වී ඇති බව ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන දර්ශක කිහිපයක් මගින් පෙන්නුම් කරන පරිදි ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වීම මෙන්ම, රජයේ සාර්ථක එන්නත් කිරීමේ වැඩපිළිවෙළත් සමඟ 2021 වසරේ අවසාන භාගයේදී ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කෙරේ. ඒ අනුව 2021 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 4.0 ක පමණ වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## දැඩි අභියෝග මධ්‍යයේ විදේශීය අංශය ශක්තිමත්ව පවතී

ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම හේතුවෙන් 2021 වසරේ ජූනි මාසයේ සිට අඛණ්ඩව මාසික අපනයන එ.ජ. ඩොලර් බිලියන 1ක සීමාව පසු කිරීමත් සමඟ අපනයන ක්‍රියාකාරීත්වයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. මේ අතර, ගෝලීය මිල ගණන් ඉහළ යෑම, අතරමැදි භාණ්ඩ සඳහා වන ඉල්ලුම, සහ පාරිභෝගික භාණ්ඩ සඳහා අපේක්ෂිත මට්ටමට වඩා වැඩි ඉල්ලුම යම් දුරකට පිළිබිඹු කරමින් ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. අඩු පිරිවැයක් සහිත ණය ලබා ගැනීමේ හැකියාවද ආනයනවල වැඩිවීම සඳහා හේතු වූ අතර, එය 2021 වසරේදී වෙළඳ හිඟය, වසංගතයට පෙර පැවති මට්ටම් දක්වා පුළුල් වීමට හේතු විය. මේ අතර, මෑත මාසවල සංචාරකයින්ගේ පැමිණීම් ඉහළ යෑමත් සමඟ සංචාරක ක්ෂේත්‍රය වර්ධනය වෙමින් පවතින බව දක්නට ලැබේ. 2021 වසරේ අවසාන භාගයේදී විදේශ සේවා

නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් තරමක් අඩු වී ඇතත්, විශේෂ දිරිගැන්වීම් යෝජනා ක්‍රම හඳුන්වාදීම සහ නීතිවිරෝධී මුදල් හුවමාරු කිරීම් මැඩලීම සඳහා බලධාරීන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් විධිමත් මාර්ග හරහා මුදල් ප්‍රේෂණ කිරීම සඳහා නව උනන්දුවක් ඇති වී තිබේ. 2021 වසරේදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 7.0කින් අවප්‍රමාණය වූ අතර, 2022 වසරේ මේ දක්වා කාලය තුළදී එය සමස්තයක් ලෙස ස්ථාවරව පවතී. එසේම, 2022 වසරේ ජනවාරි 18 වැනි දින එ.ජ. ඩොලර් මිලියන 500ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය නියමිත දිනට පියවීමට මහ බැංකුවට හැකි විය. 2021 වසර අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 3.1ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

## පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රවාහ අඛණ්ඩව වර්ධනය වේ

2021 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී මන්දගාමී වූ පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය, ආනයන මූල්‍යනය කිරීමට ලබා ගත් ණය ප්‍රවාහයන්ගේ වැඩි වීම යම් දුරකට පිළිබිඹු කරමින් මෑතකදී වර්ධනය විය. මේ අතර, රාජ්‍ය අංශය විසින් බැංකු පද්ධතියෙන් ලබා ගත් ණය, විශේෂයෙන් රජයට ලබා දුන් ශුද්ධ ණය අඛණ්ඩව ඉහළ ගියේය. මෑතකදී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑමත් සමග යම් අඩුවීමක් නිරීක්ෂණය කළද, දේශීය ණය ප්‍රමාණයෙහි සැලකිය යුතු වර්ධනයත් සමඟ 2021 නොවැම්බර් අවසානය වන විට පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, බොහෝ වෙළඳපොළ ණය පොලී අනුපාතික ඉහළ ගොස් ඇති අතර, තැන්පතු පොලී අනුපාතිකද අඩු ප්‍රමාණයකින් වුවද ඉහළ ගොස් ඇත. තවද, රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙන්දේසිවලදී ඉහළ වෙළඳපොළ සහභාගීත්වය මධ්‍යයේ, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකද ඉහළ ගොස් ඇත.

## ඇති විය හැකි ඉල්ලුම් පීඩන මධ්‍යයේ වුවද දේශීය මිල පීඩන සඳහා සැපයුම් අංශයේ සාධක ප්‍රධාන වශයෙන් හේතු වී ඇත

සැපයුම් අංශයේ අවහිරතා සහ පරිපාලිත දේශීය මිල ගණන් ඉහළ නැංවීම මෙන්ම මූලික උද්ධමනය ඉහළ යෑම හරහා පිළිබිඹු වන ආර්ථිකයේ යටිදැරි ඉල්ලුම් තත්ත්ව ශක්තිමත් වීම, දේශීය උද්ධමන පීඩන සඳහා අඛණ්ඩව හේතු විය. සැපයුම මත පදනම් වූ මිල පීඩන තාවකාලික වනු ඇතැයි අපේක්ෂා කරන අතරම ඇති විය හැකි ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන හේතුවෙන් ඉදිරි දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට මහ බැංකුව යොමු වූ අතර, එමගින් උද්ධමන අපේක්ෂා පාලනය කිරීමටද හැකි වනු ඇත.

## මුදල් සහ අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් සාර්ව ආර්ථික ස්ථායීතාව ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ

පවත්නා සහ අපේක්ෂිත සාර්ව ආර්ථික වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, සාර්ව ආර්ථික ස්ථායීතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2022 ජනවාරි මස 19 වැනි දින පැවති රැස්වීමේදී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කිරීමට තීරණය කළේය. ඒ අනුව, මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් අංක 50 බැගින් පිළිවෙළින්, සියයට 5.50 සහ සියයට 6.50 දක්වා ඉහළ නැංවීම;

(ආ) ඉන්ධන මිලදී ගැනීම් සඳහා වන අත්‍යවශ්‍ය ආනයන බිල්පත් මූල්‍යනය කිරීම බලපත්‍රලාභී බැංකු අතර ඔවුන්ගේ විදේශ විනිමය ලැබීම්වලට සමානුපාතිකව බෙදා හැරීම;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයන්ට සපයනු ලබන සේවාවන් සඳහා විදේශ විනිමය පමණක් භාර ගන්නා ලෙස සියලුම ලියාපදිංචි සංචාරක ආයතනවලට අනිවාර්යය කිරීම;

(ඈ) “විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය” යටතේ විදේශ ප්‍රේෂණ සඳහා එ. ජ. ඩොලරයක් සඳහා රුපියල් 2.00ක් වන දිරි දීමනාවට අමතරව ලබා දුන් එ. ජ. ඩොලරයට රුපියල් 8.00ක් වූ අමතර දිරි දීමනාව 2022 අප්‍රේල් මස 30 වැනි දින දක්වා දීර්ඝ කිරීම, 2022 පෙබරවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකු සහ අනෙකුත් විධිමත් ක්‍රම ඔස්සේ රුපියල් ගිණුම් වෙත මුදල් ප්‍රේෂණය කිරීමේදී ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයන්ගෙන් අයකරනු ලබන ගනුදෙනු පිරිවැය එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 1,000 බැගින් ප්‍රතිපූරණය කිරීම සහ විදේශ ශ්‍රමිකයන්ගේ විදේශ ව්‍යවහාර මුදල් සහ රුපියල් තැන්පතු සඳහා ඉහළ පොලී අනුපාතික හඳුන්වා දීම.

ඉහත සඳහන් ක්‍රියාමාර්ග හේතුවෙන් ආර්ථිකයේ ඇති විය හැකි යටිදැරි ඉල්ලුම් පීඩන ගොඩනැගීම අවම වනු ඇතැයි මුදල් මණ්ඩලයේ අදහස වූ අතර, එමගින් විදේශීය අංශයේ පීඩන ලිහිල් කිරීමට ද උපකාරී වෙමින් ඉහළ සාර්ව ආර්ථික ස්ථායීතාව ප්‍රවර්ධනය කරනු ඇත. මෙම ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන යමින්, පොලී අනුපාතිකවල, විශේෂයෙන් තැන්පතු පොලී අනුපාතිකවල වැඩිවීමක් මහ බැංකුව අපේක්ෂා කරන අතර, එමගින් ඉතුරුම් දිරිමත් කරන අතරම ආනයන සඳහා හේතුවන අධික පරිභෝජනය අධෛර්යවත් කරනු ඇත. එමනිසා, මෙම පොලී අනුපාතික ඉහළ නැංවීමට අනුව තැන්පතුකරුවන්ගේ පොලී අනුපාතික සඳහාද කඩිනමින් ක්‍රියාත්මක කරනු ලබන ලෙස මූල්‍ය ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. තවද, *සාර්ව*

*ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම මගින්* දක්වා ඇති පරිදි, වෙළඳපොළ පොලී අනුපාතිකවල අපේක්ෂිත වෙනස්වීම තුළින් වෙළඳපොළ සහභාගීත්වය වැඩි වීම හරහා මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් තොගය පහළ දැමීමට පහසුකම් සැලසෙනු ඇත. මේ අතර, මිත්‍ර රටවල් සමඟ ද්විපාර්ශ්වික එකඟතා සහ අනෙකුත් ආනයන මූල්‍යන එකඟතා තුළින් අපේක්ෂිත විදේශ විනිමය ලැබීම් සමග ඉදිරි කාලය තුළදී දළ නිල සංචිතවල ඉහළ මට්ටමක් සහතික කිරීමටත් ආර්ථිකයේ විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් කිරීමටත් අපේක්ෂා කෙරේ.

## මුදල් ප්‍රතිපත්ති තීරණය : ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවූ අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී

| | |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 5.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 6.50 |
| බැංකු අනුපාතිකය (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සමඟ ස්වයංක්‍රීයව ගලපන ලද) | සියයට 9.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 4.00 |

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙන් 2022 ජනවාරි මස 20 වැනි දින පෙ.ව. 11.00ට ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්ථාගාරයේදී මාධ්‍ය හමුවක් පැවැත්වෙන අතර එය ෆේස්බුක් සහ යූ ටියුබ් ඔස්සේ සජීවීව විකාශය කෙරේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2022 මාර්තු මස 08 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: මූර්ත ද.දේ.නි.යේ වර්ධනය (තාවකාලික)

| ආර්ථික කටයුතු | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2020 | | | | | 2021 | | | |
| | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | පළමු මාස නවය |
| කෘෂි කාර්මික | -6.5 | -8.2 | 3.1 | 1.3 | **-2.4** | 6.3 | 8.5 | 1.7 | **5.3** |
| කර්මාන්ත | -7.9 | -23.1 | 0.6 | 1.3 | **-6.9** | 5.5 | 22.1 | -2.1 | **6.8** |
| සේවා | 2.9 | -12.9 | 2.1 | 1.9 | **-1.5** | 3.0 | 7.5 | -1.6 | **2.7** |
| ද.දේ.නි | **-1.8** | **-16.4** | **1.3** | **1.3** | **-3.6** | **4.3** | **12.3** | **-1.5** | **4.4** |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: උද්ධමනය

| මාසය | | මැයි 21 | ජුනි 21 | ජුලි 21 | අගෝ 21 | සැප් 21 | ඔක් 21 | නොවැ 21 | දෙසැ 21 |
|---|---|---|---|---|---|---|---|---|---|
| මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 4.5 | 5.2 | 5.7 | 6.0 | 5.7 | 7.6 | 9.9 | 12.1 |
| | ජා.පා.මි.ද. (2013=100) | 6.1 | 6.1 | 6.8 | 6.7 | 6.2 | 8.3 | 11.1 | - |
| මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 3.2 | 3.2 | 3.7 | 4.1 | 5.0 | 6.3 | 7.0 | 8.3 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.2 | 4.1 | 4.4 | 4.7 | 4.8 | 7.2 | 8.8 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 03: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මාර් 21 | අප්‍රේ 21 | මැයි 21 | ජූනි 21 | ජූලි 21 | අගෝ 21 | සැප් 21 | ඔක් 21 | නොවැ 21 |
| සංචිත මුදල් | 1,029 | 1,031 | 1,036 | 1,065 | 1,064 | 1,089 | 1,296 | 1,286 | 1,288 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 9,839 | 9,947 | 10,033 | 10,165 | 10,304 | 10,514 | 10,488 | 10,582 | 10,546 |
| ශුද්ධ විදේශීය වත්කම් | (430) | (431) | (429) | (481) | (699) | (701) | (722) | (837) | (906) |
| ශුද්ධ දේශීය වත්කම් | 10,269 | 10,378 | 10,462 | 10,646 | 11,003 | 11,215 | 11,210 | 11,418 | 11,452 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 5,005 | 4,965 | 5,024 | 5,195 | 5,513 | 5,682 | 5,792 | 5,923 | 6,074 |
| රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය | 1,098 | 1,093 | 1,113 | 1,132 | 1,141 | 1,137 | 1,123 | 1,194 | 1,185 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 6,388 | 6,446 | 6,501 | 6,585 | 6,661 | 6,796 | 6,825 | 6,860 | 6,920 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 12,010 | 12,154 | 12,265 | 12,402 | 12,563 | 12,790 | 12,742 | 12,873 | 12,862 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 04: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2021 ජූලි අවසානයට | 2021 අගෝ අවසානයට | 2021 සැප් අවසානයට | 2021 ඔක් අවසානයට | 2021 නොවැ අවසානයට | 2021 දෙසැ අවසානයට | 2022 ජන 19 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 4.50 | 5.00 | 5.00 | 5.00 | 5.00 | 5.00 | 5.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 5.50 | 6.00 | 6.00 | 6.00 | 6.00 | 6.00 | 6.00 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 5.10 | 5.79 | 5.94 | 5.93 | 5.92 | 5.95 | 5.95 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 5.22 | 5.87 | 6.70 | 8.43 | 7.53 | 8.16 | 8.49 |
| දින 182 | 5.23 | 5.90 | 6.99 | 8.16 | 8.02 | 8.33 | 8.44 |
| දින 364 | 5.25 | 5.93 | 7.01 | 8.18 | 8.16 | 8.24 | 8.48 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 5.76 | 6.01 | 6.42 | 7.82 | 8.00 | 8.61 | 8.58 (අ) |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 9.45 | 9.38 | 9.37 | 9.49 | 9.79 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 8.09 | 8.04 | 8.14 | 8.78 | 9.18 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 4.77 | 4.75 | 4.75 | 4.79 | 4.82 | 4.94 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 5.67 | 5.62 | 5.64 | 5.70 | 5.75 | 5.94 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 4.99 | 5.19 | 5.53 | 5.96 | 6.27 | - | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 5.15 | 5.35 | 5.69 | 6.19 | 6.52 | - | - |

(අ) 2022 වසරේ ජනවාරි මස 13 වන දිනෙන් අවසන් වන සතිය සඳහා

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*